# පාසල් සිසුන්ගේ ජංගම දුරකථන භාවිතය.
## (කොළඹ දිස්ත්‍රික්කයේ ලුම්බිණි මිශ්‍ර පාසල ඇසුරින් සිදු කරනලද පර්යේෂණයකි)

යූ.කේ.ඩී. ශාන්ති[1]

**සංක්ෂේපය**

වර්තමානයේ විද්‍යාව හා තාක්ෂණවේදයේ දියුණුවත් සමග සමාජයේ බහුල වශයෙන් නවීන උපකරණ භාවිතයට නැඹුරුවක් දක්වන බව පෙනී යයි. ඒ අතර ජංගම දුරකථන සඳහා සුවිශේෂී තැනක් හිමි වේ. වර්තමානයේ බහුතරයක් ජංගම දුරකථන මගින් තම කාර්යයන් පහසු කර ගනී. එසේ වුවද පාසල් සිසුන් ජංගම දුරකථන භාවිතයට යොමු වීම විවිධ ගැටලු ඇති කිරීමට සමත් වී තිබේ. ඒ අනුව පාසල් සිසුන්ගේ ජංගම දුරකථන භාවිතය මගින් ගැටලු මතුවන්නේ කෙසේද හා ඒ සඳහා බලපාන හේතු සාධක විමර්ශනය මත මෙම අධ්‍යයනයේ ගැටළුව හා අරමුණ පදනම් වී ඇත. අධ්‍යයනය සඳහා කොළඹ ප්‍රදේශයේ පාසලක් වන ලුම්බිණි විද්‍යාලයේ 6 සිට 13 ශ්‍රේණි නියෝජනය වන පරිදි 100 දෙනෙකු නියැදිය ලෙස ගෙන ප්‍රශ්නාවලි ක්‍රමය මගින් ප්‍රාථමික දත්ත රැස් කර ගන්නා ලදි. අධ්‍යයනය මගින් ප්‍රත්‍යක්ෂ කරගන්නා ලද කරුණු අනුව සමස්ත නියැදියෙන් 75% කට ජංගම දුරකථන තිබුණු අතර ඉන් 50% ක් පිරිමි ළමුන් වූ අතර 25% ක් ගැහැණු ළමුන් විය. සිසුන්ගෙන් ලබා ගන්නා ලද තොරතුරු අනුව බහුතරයක් ජංගම දුරකථනය භාවිතා කළේ මුහුණු පොත (Facebook) භාවිතයට, අන්තර්ජාල භාවිතයට, හා වෙනත් යම් යම් කටයුතු උදෙසා වු අතර හදිසි අවස්ථාවන් හා දෙමාපියන් සමග සම්බන්ධ වීම උදෙසා දූරකථන භාවිතා කල පිරිස අල්ප විය. තව ද නියැදියෙන් 28% පිරිසක් දූරකථන භාවිතා කලේ රහසිගතව බව අනාවරණය විය. එසේම පාසල තුල ජංගම දූරකථන තබා ගැනීම තහනම් විම පිළිබඳව ඔවුන් විරුද්ධ ආකල්පයක් දැරූ අතර ජංගම දූරකථනය අද වන විට නැතිව ම බැරි උපකරණයක් බව ඔවුන්ගේ ආකල්ප වලින් ප්‍රත්‍යක්ෂ විය. අධ්‍යයනයට අනුව පිරිමි ළමුන් වැඩි වශයෙන් ජංගම දුරකථන භාවිත කළ අතර ඒ පිළිබඳ ඔවුන්ගේ නිවෙස් දැනුවත්ව නොතිබිණි. 6 සිට 11 ශ්‍රේණිවල ගැහැණු ළමුන්ගෙන් බහුතරයකට ජංගම දූරකථන නොමැති අතර ඊට සාපේක්ෂව 12 සිට 13 ශ්‍රේණි ශිෂ්‍යාවන් සතුව ජංගම දූරකථන පවත්නා බව අනාවරණය විය. මෙම කරුණු අනුව පාසල් සිසුන් බොහොමයක් එය භාවිතා කලේ සමාජ වෙබ් ජාලා හා සම්බන්ධ වීමට බව පර්යේෂණයෙන් ප්‍රත්‍යක්ෂ විය.

**මුඛ්‍ය පද :** *පාසල් සිසුන්, ජංගම දුරකථන*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
divangika214@gmail.com